සියලුම හිමිකම් ඇවිරිණි.
All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# පළමු වාර පරීක්ෂණය 2018
# පුරවැසි අධ්‍යාපනය

**06 ශ්‍රේණිය** **කාලය පැය 02 යි.**

නම/ විභාග අංකයඃ

- ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න. මෙම පත්‍රය සඳහා ලකුණු 40 ක් හිමිවේ.
- 1- 5 දක්වා ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර වරහන් තුළින් තෝරා හිස්තැන මත ලියා දක්වන්න.

---

01. ඔබ සාර්ථක පුද්ගලයෙකු ලෙස සමාජයට දායාද කරන පාසල කෙරෙහි මහත් .................................................. හා ගෞරවයක් ඔබ සතු විය යුතු වේ.
(ආදරයක්, භක්තියක්, අභිමානයක්)
02. පාසලක අධ්‍යයන කටයුතුවල නියමුවා ලෙසින් කටයුතු කරන්නේ ................................................. වේ.
(පන්ති භාර ගුරුතුමා, විෂය භාර ගුරුතුමා, විදුහල්පතිතුමා)
03. ජීව දත්ත තොරතුරු පත්‍රිකාවක් සකස් කරනවිට පළමුවෙන් ම .................................................. ලියා දක්වනු ලැබේ.
(ස්ත්‍රී පුරුෂ භාවය, ලිපිනය, මුලකුරු සමග නම)
04. අන් අයගේ අත්දැකීම් දැක ................................................................ කටයුතු කිරීම ඔබ සතු හැකියා වර්ධනය කර ගත හැකි ක්‍රමයකි.
(සාමූහිකව, නිර්මාණශීලීව, අවස්ථානුකූලව)
05. තම දුර්වලතා අන් අය පෙන්වා දුන් විට ඒවා ..................................................... පිළිගැනීම තුළින් දුර්වලතා අවම කර ගැනීමට හැකි වේ.
(කරුණාවෙන්, ආදර්ශවත් ලෙස, නිහතමානීව)

- අංක 06 - 10 දක්වා ප්‍රශ්නවල ප්‍රකාශ නිවැරදි නම් (✓) ලකුණ ද වැරදි නම් (✗) ලකුණ ද ඉදිරියෙන් ඇති වරහන තුළ යොදන්න.

06. ලෝකයේ අභියෝග ජයගත් පුද්ගලයන් සාර්ථක පුද්ගලයින් බවට පත්ව ඇත. (..........)
07. නිරන්තර අන්තර්ජාල භාවිතය ඔබ සතු දක්ෂතා වැඩිදියුණු කරදෙයි. (..........)
08. තමන්ට කළ හැකි දේට වඩා අනුන්ට අවශ්‍ය දේ සිදුකිරීම තුළින් ඔබේ දක්ෂතා වැඩි දියුණු කර ගත හැකි ය. (..........)
09. ඉවසීම අඩුකම හා අලස කම 6 ශ්‍රේණියේ සෑම සිසුවකු තුළම දැකිය හැකි ලක්ෂණයකි. (..........)
10. ඔබේ පාසල ඔබට ඔබේ දක්ෂතා ප්‍රදර්ශනය කළ හැකි අවස්ථා සම්පාදනය කරයි. (..........)

- අංක 11 - 15 දක්වා ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර දී ඇති පිළිතුරු අතරින් තෝරා යටින් ඉරක් අඳින්න.

11. තම ඉලක්ක ජය ගැනීම සඳහා ඔබට ගතහැකි ක්‍රියාමාර්ගයක් වන්නේ මින් කුමක් ද?
(1) පරිගණක භාවිතා කිරීම (2) ක්‍රීඩා හා විෂය සමගාමී කටයුතුවල නිරතවීම
(3) චිත්ත ධෛර්ය වර්ධනය සඳහා භාවනා කිරීම (4) දක්ෂ සිසුන් දෙස බලා සතුටු වීම
12. ඔබ දෛනික කාල සටහනකට අනුව කටයුතු කිරීම තුළින් සිදුවන විශේෂ වාසිය මින් කුමක් ද?
(1) වැඩ කල් දැමීමට උනන්දු වීම (2) අත්‍යවශ්‍ය පියවර අත් හැරීමට කටයුතු කිරීම
(3) වැඩ කටයුතුවල ආතතියෙන් යුතුව යෙදීම (4) කාලය ඵලදායී ලෙස ප්‍රයෝජනයට ගැනීම



LIVEWORKSHEETS

13. පාසල තුළ පවතින සම්ප්‍රදායන් රැක ගැනීම තුළින්,

(1) අනාගත සිසු පරපුරට ඒවා පවරා දීමට හැකි වේ.

(2) පාසල සම්ප්‍රදායානුකූල පාසලක් බවට පත් වේ.

(3) දරුවන්ගේ ආත්මාභිමානය අඩු වේ.

(4) පාසලේ ඉදිරි සංවර්ධනය අඩාල වේ.

14. පාසල් ගීතය ගායනා කරන අවස්ථාවේදී ප්‍රදර්ශනය කළ යුතු නිවැරදි ඉරියව් අඩංගු පිළිතුර තෝරන්න.

(1) පහසුවෙන් සිටීම හා හිස සෘජුව තබා ගැනීම

(2) සීරුවෙන් සිටීම හා හිස සෘජුව තබා ගැනීම

(3) සීරුවෙන් සිටීම හා පාසල් ගීය මතකයෙන් ගායනා කිරීම

(4) පහසුවෙන් සිටීම හා පාසල් ගීය මතකයෙන් ගායනා කිරීම

15. පාසලක ''දැක්ම'' තුළින් ප්‍රකාශ වන්නේ මින් කවර කරුණක් ද?

(1) පාසලේ අධ්‍යයන කටයුතු පිළිබඳව.

(2) රටට යහපත් පුරවැසියන් බිහිකිරීම පිළිබඳව.

(3) අනාගතයේදී ඉටුකර ගැනීමට බලාපොරොත්තු වන අරමුණු පිළිබඳ ව.

(4) ගුණ නුවණින් හා හැකියාවන් සහිත දරු පරපුරක් බිහි කිරීම පිළිබඳව.

- අංක 16 - 20 දක්වා ප්‍රශ්නවලට පහත සඳහන් ඡේදය සම්පූර්ණ කරන්න.

අධ්‍යාපනය ලැබීම ඔබේ (16) ..................................................... කි. හොඳින් ඉගෙනීමේ කටයුතුවල නිරතවීම, සෙසු ළමයින් සමග (17) ............................................................. යුතුව කටයුතු කිරීම ඔබගේ (18) ....................... .................................. වේ. එමෙන් ම ඔබේ යහළු යෙහෙළියන් අයහපත් ක්‍රියාවල යෙදීමෙන් (19) .................... ............................................ ද ඔබට හිමි වගකීමකි. සැමවිටම පාසල තුළ ඇති සම්පත් (20) ................................ ........................................... ලෙස පරිහරණය කිරීමෙන් ඔබට මෙන් ම අනාගත පරපුරට ද අධ්‍යාපනය ලැබීමට හිමි දැ සුරක්ෂිත වේ.



LIVEWORKSHEETS